# දීඝනිකාය : අන්තර්ගතයේ කාල නිර්ණය පිළිබඳ විමසුමක්

දීඝ නිකායේ සංග්‍රහ වී ඇති සූත්‍ර සියල්ල එකම යුගයකට අයත් යැයි සැළකිය නොහැකිය. බුදු සමයේ ආදි යුගයට මෙන්ම පසු යුගයට අයත් සූත්‍ර ද මෙහි ලා සංග්‍රහ වී ඇති බව පෙනේ. ඇතැම් පැරණි සූත්‍රයක පශ්චාත් කාලයක ප්‍රවිෂ්ට කරන ලදැයි සිතිය හැකි පාඨ හා ගාථා ද දැකිය හැකිය. අන්තර්ගත විෂය කරුණු පමණක් නොව කරුණු ඉදිරිපත් කිරීමේ ස්වරූපය ද (ආකෘතිය) දීඝනිකායගත සූත්‍ර එක් යුගයට අයත් නොවන බවට දැක්විය හැකි සාධකයෝය.

දීඝ නිකායේ මුල්ම සූත්‍ර දෙක බ්‍රහ්මජාල හා සාමඤ්ඤඵල බවට සැකයක් නොමැත. ඊට හේතුව එම සූත්‍ර දෙක ගැන චුල්ලවග්ගයේ පඤ්චසතිකක්ඛන්ධකයේ සඳහන් කර තිබීමයි. ඒ මෙසේය:

"බ්‍රහ්ම ජාලං ආවුසො ආනන්ද කත්ථ භාසිතන්ති අන්තරාච භන්තෙ රාජගහං අන්නරාච නාලන්දං රාජාගාරකේ අම්බලට්ඨිකායනති" (ඇවැත් ආනන්දයෙනි බ්‍රහ්මජාල සූත්‍රය කොහි සිට දේශනා කරන ලද්දක්ද? ස්වාමිනි ! රජගහ නුවරටත් නාලන්දාවටත් අතර රාජාගාරයෙහි අම්බලටයිකා වේදිය)

"සාමඤ්ඤඵලං පනාවුසො ආනන්ද කත්ථ භාසිතන්ති රාජගහෙ භන්තෙ ජීවකමබවනෙති" (ඇවැත් ආනන්ද සාමඤ්ඤඵල සූත්‍රය කොහි සිට දේශනා කරන ලද්දක්ද? ස්වාමිනි, රජගහ නුවර ජීවක නම් අඹ වනයේ දිය)

සූත්‍ර පිටකයේ බොහෝ සූත්‍රවල ආරම්භක ජේදය වශයෙන් එන " එවං මෙ සුතං එකං සමයං භගවා" යන්න ඒවාට ප්‍රවිෂ්ට කරන ලද්දේ සංගීතිවලදී බවට චුල්ලවග්ගයේ ඉහත සූත්‍ර දෙක නිදර්ශන කොට දැක්විය හැකි බව කිව යුතුය. බ්‍රහ්මජාල සූත්‍රය දේශනා කරන විට දසදහසක් ලෝක ධාතු කම්පා වී යැයි සූත්‍රාවසනයේ සඳහන් වේ. එම පාඨය සූත්‍රයට එකතු කරන ලද්දේ පසුකාලීනව විය යුතු බව විචාරක මතයයි. එම අවස්ථාවේ මහ පොළොව කම්පා වූ බව අටුවාවේ සඳහන් වේ. මේ පුවත මෙයට ඈඳා ඇත්තේ සූත්‍රයේ විශේෂත්වය වාච්‍ය කිරීමට පසුකාලීනව බව විචාරක මතයයි. දීඝනිකායේ සූත්‍ර 34න් දෙකක් බුදු හිමි පිරිනිවීමෙන් පසු ශ්‍රාවකයන් විසින් දේශනා කරන ලද බව එම සූත්‍රවලම දක්වා ඇත. සීලක්ඛන්ධ වර්ගයේ සුභ සූත්‍රයේ මෙසේ සඳහන් වේ. "අචිර පරිනිබ්බුතෙ භගවති" (භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන් පා නොබෝ කල්හි)

අනෙක් සූත්‍රය නම් මහාවර්ගයේ පායාසි රාජඤ්ඤ සූත්‍රයයි. එය බුද්ධපරිනිර්වාණයෙන් වසර 50කටවත් පසුකාලීන විය යුතු බව රීස් ඬේවිඩ්ස් මහතාගේ අදහසයි. එසේම පායාසි සූත්‍රයට අදාළ දෙබස ජෛනයන් අතර ද දැකිය හැකිය යන්න ඔහුගේ තවත් මතයකි. (We also find a version of this dialogue among the jains) (එය රායපසේණී සූත්‍රය වශයෙන් ඔලිවර් අබේනායක හා බුද්ධදත්ත හිමි කියති) මෙය උපුටා දක්වන වින්ටර්නිට්ස් පඬිතුමා පායාසි සූත්‍රය වෙනත් තැනකින් ගත් ඉතිහාස දෙබසක් වශයෙන් තම "A History of Indian Literature, vol ii" නම් ග්‍රන්ථයේ 44 පිටුවේ මෙසේ දක්වා ඇත.

"However even this sutta is not original, but is an ithihasa dialogue, enlarge to its disadvantage which has been borrowed from another sect."

මහා පරිනිබ්බාණ සූත්‍රය ද යුග කිපයක කොටස් වලින් සමන්විතව සංවර්ධනය වූ ධර්මපරියායක් වශයෙන් පෙන්වා දිය හැකිය. මෙහි මූලික ප්‍රස්තුතයට ත්‍රිපිටකයේම අංගුත්ත නිකාය, සංයුත්ත නිකාය හා විනය පිටකය යනාදි තැන්වලින් කොටස් ගෙන සංවර්ධනය කරන ලද්දක් බව බොහෝ විද්වත් මතයයි. එම පසුකාලීන කොටස් ඉවත් කළහොත් සූත්‍රය 1/3 කට පමණ කෙටි කළ හැකි බව රීස් ඬේවිඩ්ස් මහතා පෙන්වා දී ඇත. කොටස් 6කින් යුත් මෙම මහා පරිනිර්වාණ සූත්‍රයේ හයවෙනි බණවරේ එන ධාතු විභජනයත් දසවූපකරනයත් සංගිතිකාරක භික්ෂුන් විසින් ප්‍රවිෂ්ට කරන ලදැයි සුමංගල විලාසිනි දීඝ නිකාය අටුවාව මෙසේ දක්වයි.

"එවමෙතං භූත පුබ්බන්ති, එවමෙතං අතිතෙ ධාතුනිධානමපි ජම්බු දීපතලෙ භූත පුබ්බන්ති, තතිය සංගීතිකාරා පි ඉමං පදං ඨපයිංසු" (එවමෙතං භූත පුබ්බන්ති, එවමෙතං අතීතෙ ධාතු නිධානමපි ජම්බු දීපතලේ භූත පුබ්බන්ති යන කොටස් තෙවැනි සංගීති කාරකයින් විසින් තබන ලදි). එසේම සූත්‍රය අවසානයේ එන ගාථා 5 ද සිංහල දේශීය භික්ෂුන්ගේ ප්‍රබන්ධ වශයෙන් එම අටුවාව තවදුරටත් විස්තර කර ඇත.

"අට්ඨ දොණං චක්ඛු මතො සරීරංති ආදි ගාථායො පන තම්බපණ්ණිථෙරෙහි වුත්තා" (අට්ඨදොණං චක්ඛුමතො සරීරංති යනාදි ගාථා තම්බපණ්ණි තෙරුන් විසින් කියන ලදි).

මෙම ගාථා 5ට බුද්ධ වංශයේ ද සමාන ගාථා දක්නට ලැබෙන නිසා මෙම කියමන තවදුරටත් ශක්තිමත් වන බව ඔලිවර් අබේනායක මහතා ගේ අදහසයි. පරිනිර්වාණ සූත්‍රය ගැන අදහස් දක්වන වින්ටර්නිට්ස් පඬිතුමා තම "A History of Indian Literature" නම් ග්‍රන්ථයේ ඉතා

කෙටියෙන් තිබුණු පරිනිර්වාණ සූත්‍රයට බාහිරව කරුණු එකතු වීමෙන් එය වර්ධනය වී අද විද්‍යමාන තත්වයට පැමිණි බව 39 පිටුවේ මෙසේ දක්වා ඇත.

"At a very early period- probably soon after the death of Buddha – there must already have been a short "Sutta of perfect Nirvana (of the Buddha) which by means of interpolations and additions grew longer and longer in course of time till it become the "great Sutta of the perfect nirvana which we now have in our Pali canon"

එසේම සංගීති දසුත්තර යන සූත්‍ර දෙක අංගුත්තර නිකායට හා අභිධර්මයේ ව්‍යාකරණ ලක්ෂණයට සමාන නිසා ඊට පෙර මෙම සූත්‍ර දෙක සංස්කරණය වී ඇති බව විචාරක මතයයි. ඒවායේ කරුණු සංඛ්‍යාත්මක පදනමකින් සකසා තිබීම ඊට හේතුව වශයෙන් දක්වා තිබේ. ඒවා දීඝනිකායට ඇතුළත් නොවූයේ නම් අංගුත්තර නිකායට හෝ අභිධර්ම පිටකයට ඇතුළත් වීමට ඉඩ තිබුණි.

දීඝනිකායේ එය සූත්‍ර 17ක්ම පශ්චාත් ගණයට වැටෙන සූත්‍ර යැයි පාණ්ඩේගේ මතයයි. පශ්චාත් හා පැරණි කොටස් අන්තර්ගත සූත්‍ර මීට ඇතුළත් නොවේ. ස්ථිර වශයෙන්ම පැරණි බව හඳුනා ගත හැක්කේ සාමඤ්ඤඵල සූත්‍රය හා තේවිජ්ජ සූත්‍රය පමණක් බව ඔහු කියා ඇත. පැරණි හෝ පශ්චාත් ගණයේ ලා සැළකිමට ප්‍රබල සාධක නැති හෙයින් කාල නිර්ණය කිරීමට අපහසු සූත්‍රාන්ත 9ක් පමණ දීඝනිකායේ ඇති බව පාණ්ඩේ තවදුරටත් සඳහන් කර ඇත. දීඝ නිකායේ සූත්‍ර පිළිබඳ උගතුන්ගේ අදහස් එකිනෙකට පරස්පර බව මින් පෙනෙන්නකි. මහා පරිනිර්වාණ සූත්‍රයේ සමහර කොටස් හැරුණු විට දෙවන සංගායනාවෙන් මෙහා යැයි ගත හැකි කිසිදු සූත්‍රයක් හෝ පාඨයක් මුළු දීඝනිකායේම දක්නට නැති බව ඇතැම් විචාරකයෙකුගේ පිළිගැනීමයි.

දීඝ නිකායේ මහාවග්ගය සිලක්ඛන්ධ වර්ගයට වඩා ආකෘතිමය වශයෙන් විශේෂත්වයක් පෙන්වන බව පෙනේ. සීලක්ඛන්ධ වර්ගයේ මාධ්‍ය සම්පූර්ණයෙන්ම ගද්‍යයි. අම්බට්ඨ සූත්‍රයේ දෙවරක් යෙදී ඇති එක් ගාථාවක්ද කේවට්ට සූත්‍රයේ අවසානයේ යෙදී ඇති ගාථා 3ක් ද හැරුණු විට සිලක්ඛණ්ධ වර්ගයේ කිසිදු සූත්‍රයක ගාථා දක්නට නොලැබේ. නමුත් මහා වර්ගයේ නිග්ගාථක ගද්‍ය මාධ්‍යයෙන් සංග්‍රහ කොට ඇත්තේ මහනිදාන සූත්‍රයත් මහා සතිපට්ඨාන සූත්‍රයත් පමණි. මහා සුදස්සන පායාසි රාජඤ්ඤ යන සූත්‍රද්වයෙන් එක් සූත්‍රයක එක බැගින් ගාථා 2කි. මහාවර්ගයේ අනෙක් සූත්‍රයන්හි ගාථා බාහුල්‍ය සාමාන්‍ය ලක්ෂණයකි. සක්කපඤ්හ සූත්‍රයෙන් බුදුහිමි පඤ්චසිඛ විසින් ගයන ලද රාගනිශ්‍රිත ගාථා පන්තියක් බුද්ධූප සංහිත ධම්මූපසංහිත අරහන්තූප සංහිත යන පදයන්ගෙන් වර්ණණා කරන අපූර්ව ප්‍රවෘත්තිය

සඳහන් වේ. සිලක්ඛන්ධ වර්ගයේ ගාථා 4කි. පුනරුක්ති වශයෙන් යෙදි ඇති ගාථා සංඛ්‍යාව 200 ඉක්මවයි. මහා වර්ගයේ ගාථා අලුත් දහම් කොටස් ඉදිරිපත් කරනු වෙනුවට ගද්‍යයෙන්ම ආ කරුණු පද්‍යයට යොදා ප්‍රකාශ කරන ආකාරය පෙනේ. ජනවසභ සූත්‍රයේ එය මෙසේය.

උදා: **ගද්‍යය**

''යථා ඛො මාරිස නිමිත්තානි දිස්සන්ති උලාරො ආලොකො සඤ්ජායති ඔභාසො පාතුභවති බ්‍රහ්මා පාතුභවිස්සති. බ්‍රහමුණො හෙතං පුබ්බනිමිත්තං පාතුභාවාය යදිදං ආලොකො සඤ්ජායති ඔභාසො පාතුභවති''

**පද්‍යය** ''යථා නිමිත්තා දිස්සන්ති බ්‍රහ්මා පාතුභවිස්සති
බ්‍රහමුණො හෙතං නිමිතත්ං ඔභාසො විපුලොමහාති''

මහා වර්ගයේ ගද්‍ය ශෛලියේ නව නැම්මක් ද දක්නට ලැබෙන බව මහා සුදස්සන සූත්‍රය පරික්ෂා කිරීමෙන් පෙන්විය හැකිය. එහි කුසාවතී නගරයේ සෞභාග්‍යය කවි බසින් වනනු දක්නට ලැබේ.

''සෙය්‍යථා පි ආනන්ද දෙවානං ආලකමන්දානාම රාජධානි ඉද්ධාවෙච ඵීතාච බහුජනාච ආකිණ්ණයක්ඛාච සුභික්ඛාච එවමෙව ඛො ආනන්ද කුසාවති රාජධානි ඉද්ධාවෙච අහෝසි ඵීතාච බහුජනාච ආකිණ්ණ මනුස්සාච සුභික්ඛාච කුසාවති ආනන්ද රාජධානි දසහි සද්දේහි අවිවිත්තා අහෝසි දිවාවෙච රත්තිංච''

මේ සඳහා උපයුක්ත උපමා උපමේය සහිත අලංකාරණාත්මක භාෂාව දෙස අවධානය යොමු කරන විචාරකයෝ මෙහි භාෂාව අර්ථයට මුල් තැන දුන් සරල ශෛලියට වඩා සාඩම්බර වාග් රීතියක් අනුගමනය කර ඇති බව ප්‍රකාශ කරති. එබඳු භාෂා රීතිය නැකම් දක්වන්නේ පසු කාලයට බව විචාරක මතයයි. ගාථා බාහුල්‍ය ද මුල් යුගයේ නොතිබුණු අතර එය ද පශ්චාත් යුගයකට අයත් ලක්ෂණයක් බව විචාරක අදහසයි.

පාටික වර්ගයේ මුල් සූත්‍ර හයෙත් අවසාන සූත්‍ර දෙකේත් ගාථා දක්නට නොලැබේ. මුල් වර්ගයේ අම්බට්ඨ සූත්‍රයේ එන ගාථාව යළිත් වරක් අග්ගඤ්ඤ සූත්‍රයේ දක්නට ලැබීම හැරුණු විට මේ සූත්‍ර අටම හුදු ගද්‍යයෙන් සංග්‍රහ කොට ඇත. ලක්ඛණ හා සිගාල යන සූත්‍ර දෙක පද්‍ය බාහුල්‍යයෙන් යුක්තය. පාටික වර්ගයේ එන චම්පූ ලක්ෂණය දක්නට ලැබෙන අනෙක් ධර්මපරියාය නම් ආටානාටියයි. මේ සූත්‍රයේ වැඩි කොටසක් රචනා වී ඇත්තේ ගාථා මාධ්‍යයෙනි. මෙපමණ දුරට ගාථා උපයුක්ත වී ඇති අනෙක් සූත්‍රයක් දීඝනිකායේම දක්නට

නැත. මේ අනුව ගාථා මාධ්‍ය සිලක්ඛන්ධ වර්ගයේ දක්නට ලැබෙන ප්‍රමාණයට වඩා මහා වර්ගයේ ව්‍යාප්ත වී ඇති අතර පාටික වර්ගයේ දී එය අලුත් ස්වරූපයකින් වැඩි දියුණු වී යන ආකාරයක් පැහැදිලි වේ.

අන්තර්ගත විෂය කරුණු අනුව ද සලක්ඛන්ධ වර්ගය ඉතිරි දෙකට වඩා ඉපැරණි යැයි සිතිය හැකිය. එහි ශාස්තෲන් වහන්සේගේ මුල්ම දේශනාවට අන්තර්ගත කරුණු සංග්‍රහ වී ඇති බව විචාරක මතයයි. එනම් සාමඤ්ඤඵල සූත්‍රයේ එන සීල සමාධි ප්‍රඥා යන ත්‍රිශික්ෂාව සමස්ථ වර්ගයේම දැකිය හැකි වීමයි. නමුත් මේ ත්‍රිශික්ෂාව සිලක්ඛන්ධ වර්ගයේ අවසාන තේවිජ්ජ සූත්‍රයෙන් විද්‍යමාන නොවේ යැයි බාපත් මහතා පවසයි. එහෙත් එයින් සාමඤ්ඤඵල සූත්‍රයේ එන කරුණු උපුටා දක්වා බෞද්ධ මාර්ගය පැහැදිලි කොට ඇතැයි ඔලිවර් අබේනායක මහතා තම 'දීඝනිකාය සමාලෝචනය' නම් ලිපියෙන් දක්වා ඇත. එම නිසා මෙම වර්ගයේ සූත්‍රවල පදනම සම බවක් දක්වන නිසා එකම වකවානුවකට අයත් යැයි විචාරකයෝ අදහස් දක්වති. විචාරකයින්ට අනුව සිලකඛන්ධ වර්ගයේ සූත්‍රවල කාලය දළ වශයෙන් බුද්ධ පරිනිර්වාණයෙන් දශකයක් පමණ වේ යැයි කිව හැකිය.

ප්‍රථම වර්ගයේ දි බුද හිමි නිරූපණය වී ඇත්තේ මානුෂික පෞරුෂත්වකින් යුතු ශාස්තෘවරයකු විලසිනි. උන්වහන්සේගේ අතිමානුෂිකත්වය කියැවෙන

ජේද එහි සරල බව සාමඤ්ඤඵල තේවිජ්ජ සොණ්දණ්ඩ කේවට්ට යන සූත්‍ර පිරික්සීමෙන් පෙනේ. මේ වර්ගයේ සූත්‍රවල එන්නේ එකම සම්මා සම්බුදුවරයෙකි. බුදුහිමි මනුෂ්‍ය විෂය ඉක්ම වූ සෘද්ධි ප්‍රාතිහාර්ය වැනි ශක්ති විශේෂතා ප්‍රදර්ශනය කරන ආශ්චර්ය අද්භූත පුද්ගලයකු වශයෙන් නොව මාර්ගය කියා දෙන උතුමෙකු සේ මෙහි පෙන්වා දී ඇත. දෙතිස් මහා පුරිෂ ලක්ෂණ ගැන සඳහන් වෙතත් ඒවා විස්තර කිරීමට කිසිදු උත්සාහයක දරා නැති බව අම්බට්ඨ වැනි සූත්‍රවල ලකුණු දෙකක් පමණක් විස්තර කර තිබීමෙන් පැහැදිලි වේ.

ප්‍රථම වර්ගයේ ජනකථා දේවකථා හා අනේක විධ ගණයේ කථාන්තරවලට අවධානය යොමු කොට ඇත්තේ ඉතාම අල්ප වශයෙනි. බුදු හිමි ධර්මය විග්‍රහ කිරීමේ දි ජාතක උපයෝගී කර ගත් බවට සැකයක් නැත. ඒ බව එය නවංගසත්ථු ශාසන අංගයක් වශයෙන් අලගද්දූපම සූත්‍රයේ දැක්වීමෙන් තහවුරු වේ. නමුත් මෙවැනි කථා සිලක්ඛන්ධ වර්ගයේ අල්පය. ඒ හැරුණු විට දෙවිබඹුන් ගැන විශ්වාස පළ කරන සූත්‍ර ද ප්‍රථම වර්ගයේ දක්නට නැත. කේවට්ට සූත්‍රයේ දී එක් භික්ෂුවක් සතර මහා භූතයන් නිරවශේෂ වශයෙන් නිරුද්ධ වන්නේ කොහිදැයි දැන ගනු කැමති බව දෙවි බඹුන් කරා ගොස් පසුව මහා බඹු විසින් ඔහු බුදු හිමි වෙත යොමු කරන විස්තරයක් එයි. ඉන් දෙවි බඹුන් උපහාසයට ලක් කිරීමක් මිස විශ්වාසය පළ කිරීමක් නොවන බව කිව යුතු නොවේ.

බෝධිසත්ව සංකල්පය පිළිබඳ මුල් සටහන එන්නේ මහ පදාන සූත්‍රයේය. එනම්

"අථබො භික්ඛවෙ විපස්සි බෝධිසත්තො තුසිතා කායා චවිත්වා සතො සම්පජානො මාතු කුච්ජිං ඔකකම් අයමෙත්ථ ධම්මතා" (ඉක්බිති, මහනෙනි විපස්සි බෝසත් තුසිත ලොවින් චුතව මනා සිහියෙන් මව්කුසට බැස ගත්තේය. මෙය ධර්මතාවයකි).

එහි පෙර විසූ බුදුවරුන් 6දෙනෙකු ගැන ද ඉන් විපස්සී බුදු හිමි ගැන විශේෂයෙන් ද සඳහන් වේ.

බුදුවරයෙකු පිළිබඳ මුල්ම චරිත කථාව එන්නේ මෙම පදාන සූත්‍රයේය. (විපස්සි) මහායානිකයන් අසංඛ්‍ය බුදුවරුන් දක්වා වර්ධනය කරන ලද බහු බුද්ධ සංකල්පයේ ආදි අවස්ථාව මෙම සූත්‍රයයි. අපදාන යන සාහිත්‍යාංගය ජනප්‍රිය වූයේ පසු කාලයේ බව බුද්දක නිකායට අයත් අපදාන නම් වූ සංග්‍රහයෙන් හෙලි වේ. එසේම අවදාන හෙවත් අපදාන ජනප්‍රිය අංගයක් බවට පත් වූයේ ථේරවාදීන් අතර නොව සර්වස්තිවාදින් අතර බව පැහැදිලි කරුණකි.

මහා පරිනිර්වාණ සූත්‍රයේ දි මෙම බුද්ධ සංකල්පයේ තවදුරටත් ව්‍යාප්තිය දැකිය හැකිය. එනම් සතර ඍද්ධිපාද වැඩූ කෙනෙකුට අවශ්‍ය නම් කල්පයක් වුව ජීවත් විය හැකි යැයි ද අනඳ හිමිගේ ආරාධනය ලැබුනේ නම් බුදුහිමි කල්පයක් ජීවත් වන්නේ යැයි ද එහි දැක්වේ. මෙය බුදු හිමි අතිශයෝක්තියට නැගුණු යුගයට අයත් අදහසක් බව කියැවේ. මහපොළොව කම්පා වීම සතර ඍද්ධිපාද වැනි ආශ්චර්යමත් අලංකාර නිසා එම කොටස් පසුකාලීන බව වින්ටර්නිට්ස්ගේ මතයයි. පරිනිර්වාණ සූත්‍රයේ මුලින් එන සාමාන්‍ය මානුෂික ලක්ෂණවලින් හෙබි බුද්ධ චරිතය එහි ම මෙවනි අද්භූත දෙයින් සැරසීම නිසා බුදු හිමි මැජික් කරුවෙකු සේ නිරූපණය වී ඇතැයි ඔහු තම A History of Indian Literature නම් ග්‍රන්ථයේ මෙලෙස දක්වා ඇත.

"We see him other parts of the text, performing miracles like a demigod or a magician, indeed he losts of his magic power"

බුද්ධ බහුත්ව වාදය තවදුරටත් ව්‍යාප්ත කරමින් තුන් කාලයට අයත් බුදුවරු ගැන ද මහා පරිනිබ්බාණ සූත්‍රය සඳහන් කරයි.

"කිනෙත සාරිපුත්ත යෙ තෙ අහෙසුං - අතීතමද්ධානං අරහනෙතා සම්මාසම්බුද්ධො"
(සාරිපුත්‍ර (කිම?) අතිතයේ සම්මා සම්බුදුවරු සටියාහුය).

''කිම්පන තෙ සාරිපුත්ත යෙ තෙ භවිස්සති අනාගතමද්ධානං අරහනෙතා සම්මා සම්බුදෙධා''
(සාරිපුත්‍ර (කිම?) අනාගතයේ සම්මා සම්බුදුවරු වන්නාහුය).

''කිම්පන තෙ සාරිපුත්ත අහං එතරහි අරහං සම්මා සම්බුද්ධො''
(සාරිපුත්‍ර (කිම?) මම වනාහි වර්තමාන සම්මා සම්බුදුවරයා වෙමි).

දෙතිස් මහා පුරිස ලක්ෂණ මෙම වර්ගයේ දී තවදුරටත් සනාථ කරමින් අතීත බුදුවරයන්ට ද දෙතිස් මහා පුරිස ලක්ෂණ තිබූ බව මහාපදාන සූත්‍රයේ කියැවේ.

සීලක්ඛන්ධ වර්ගයේ පුරාවෘත්ත එකක් වුවද මෙම මහා වර්ගයේ සූත්‍ර රාශියක් දැකිය හැකිය. ඉන් සුදස්සන සූත්‍රය ගෞතම බුදුහිමි මහා සුදස්සන නමින් ඉපිද සිටි සමයක කුසිනාරා නගරය මහත්සේ දියුණුව පැවැති සැටි විස්තර කෙරේ. අනෙක් සූත්‍රය නම් මහා ගෝවින්ද සූත්‍රයයි. එහි බෝසතාණන් දිසම්පති රජුට අනුශාසනා කරමින් ගෝවින්ද නමින් පුරෝහිතයෙක්ව සිටි පැරණි වෘතාන්තයක් ගෙන හැර පායි. මහා පදාන සූත්‍රයේ පරමාර්ථය ද විපස්සී බුදු හිමිගේ චරිත කථාව දැක්වීමයි. මහාපදාන ගෝවින්ද යන සූත්‍ර දෙක සූත්‍රාන්ත ජාතකයන් අතර විශේෂ ස්ථානයක් ගන්නා බව චුල්ලනිද්දේසයේ සඳහන් වේ. මහා ගෝවින්ද සූත්‍රය ජාතක ස්වරූපයෙන් ඇත්ව අංගුත්තර නිකායේ ද දැක්වේ. එමනිසා ඊට වඩා පැරණි ග්‍රන්ථයක් වන දීඝනිකායේ එය ජාතක ස්වරූපයෙන් දක්නට ලැබීම නිසා එය පසුකාලීනව ප්‍රවිෂ්ට වූවක් බව B C ලෝ මහතාගේ අදහසයි. පරිනිර්වාණ සූත්‍රය ද ගෞතම බුදුහිමිගේ අවසාන සමය පිළිබඳව වාර්තාමය ස්වරූපයක විස්තරයක් ඉදිරිපත් කරයි. මෙම දෙවන වර්ගයේ 'මහා' යන්න ද ඊට ඇදීමට හේතු වූයේ මෙම විෂය බද්ධ කරුණු හා පුරාවෘත්ත වලින් එම සූත්‍ර දීර්ඝ වීම නිසා බව විද්වත් මතයකි.

දේව විශ්වාස කථා හා මිථ්‍යා ප්‍රබන්ධ ගැන විශේෂ උනන්දුවක් මහා වර්ගයේ සූත්‍රවල දක්වා ඇති බව ජනවසභ වැනි සූත්‍ර වලින් පෙනේ. එහි බිම්බිසාර රජු ජනවසභ නම් රජෙක්ව ඉපිද බුදුහිමි මුන ගැසීමට ආ ප්‍රවෘත්තිය මෙම සූත්‍රයේ විස්තර වේ. තව්තිසා දෙව් ලොව සුධර්මා දේව සභාව සනංකුමාර බ්‍රහ්මයා ආදීන් අපට මෙහිදී දැකිය හැකිය.

සනංකුමාර හා පඤ්චසිඛ නැවත මහාගෝවින්ද සූත්‍රයෙන් හමුවේ. මහාසමය සූත්‍රය සම්පූර්ණයෙන්ම දේව නාමාවලියකි. කපිල වස්තුව අසල මහාවනයේ මහා දේව සමාගමයේ දී බුදු රදුන් දෙස ''සම්මා පරිබ්බාජනිය'' ආදි සූත්‍ර කීපයක් ඇති නමුත් ඒවා මෙම සූත්‍රයට ප්‍රවිෂ්ට වී නැති බව පොල්වත්තේ බුද්ධදත්ත හිමියන් දක්වා ඇත. එම සූත්‍ර කොටස් සියල්ලම

පාහේ ඛුද්දක නිකායේ සුත්ත නිපාතයට ඇතුළත් ව  ඇතැයි එහිමියෝ පෙන්වා දෙති. එමනිසා වර්තමාන මහාසමය සූත්‍රය තුන්වෙනි සංගායනාවටත් පසුව දෙවියන් ගරු කරන කිසියම් මහායානික ආචාර්යවරයෙකු විසින් ගොතන ලද්දකැයි ද උන්වහන්සේ පාලි සාහිත්‍යය නම් ග්‍රන්ථයේ සඳහන් කර තිබේ. බුදුහිමි දැකීමට රිසි වූ සක්‍රයා මුලින්ම පඤ්චසිඛ දේව පුත්‍රයා එවා පසුව පැමිණෙන අයුරු සක්කපඤ්හ සූත්‍රයේ දැක්වේ.

වැදගත් ධර්ම කරුණු සාකච්ඡා කිරීම සීලක්ඛන්ධයේ ලක්ෂණයක් වුවද මහාවර්ගයේ සූත්‍ර 3ක්ම දේව බ්‍රහ්මාදි අමතර විස්තර සඳහා මිඩංගු කර ඇති අයුරු මහාසමය මහා සුදස්සන හා මහා ගෝවින්ද යන සූත්‍රවලින් පෙනේ.

බ්‍රහ්මජාල සූත්‍රයේ පටිච්චසමුප්පාදයට වඩා සංවර්ධනය වූ ආකාරයක් මහාවග්ගයේ මහානිදාන සූත්‍රයේ පෙනේ. එනම් බ්‍රහ්මජාලයේ ඇත්තේ වේදනා තණ්හා උපාදාන භව ජාති හා ජරාමරණ යන අංග 6 පමණි. නමුත් මහානිදාන සූත්‍රයේ විඤ්ඤාණ නාම රූප සළායතන ඵස්ස වේදනා තණ්හා උපාදාන භව ජාති හා ජරාමරණ යන අංග 10ක් දක්වා ඇත. එමනිසා මුල් වර්ගයට වඩා දෙවන වර්ගයේ පටිච්ච සමුපපාදය වර්ධනය වී ඇති අයුරු පෙන්විය හැකිය.

දෙවන වර්ගයේ එය මෙම විෂය බද්ධ කරුණුවල සංවර්ධනය තුන්වෙනි පාටික වර්ගයේ ද දැකිය හැකිය. එහි මුලින්ම එන සූත්‍රයේ (පාටික) බුදුහිමි බාහිර බල විශේෂ ප්‍රයෝජනයට ගත් උතුමෙකු වශයෙන් දැක්වීමට උත්සාහ දරා ඇත. ප්‍රථම වර්ගයේ කේවට්ට මහාලි යන සූත්‍රවල ද ඍද්ධි ප්‍රාතිහාර්ය ගැන සඳහන් වේ. නමුත් ප්‍රාතිහාර්ය අගය කරන බුදුහිමි ලවා පෙලහර පානු පාටික සූත්‍රයෙන් පෙනේ. දෙතිස් මහ පුරිස ලක්ෂණ සඳහා මිඩංගු කර ඇති ලක්ඛණ සූත්‍රය ඇත්තේ ද පාටික වර්ගයේ ය. එම ලකුණු උරුම කර ගැනීමට පෙර ආත්මයන්හි කරන ලද කුශල කර්මත් අතිශයෝක්තියෙන් දැක්වීම නිසා එය 'කම්මසරික්ඛතාව' ප්‍රබල වූ සමයක යම්කිසි කවියෙකු ගේ ප්‍රබන්ධයක් විය හැකිය. සම්පසාදනිය හා පාසාදික සූත්‍ර මගින් බුදුහිමිගේ පෞරුෂය නැවතත් තහවුරු කර ඇතත් පාටික වර්ගයේම එන ආටානාටිය සූත්‍රයේ නැවතත් සත් බුදුවරුන් ගැන දක්වා ඇත.

බුද්ධ වංශය හැරුණු විට මුළුමහත් ත්‍රිපිටකයේම ඇති ධර්ම පරියායන් අතරින් අනාගතේ පහළ වන මෛත්‍රී නම් බුදු හිමි ගැන සඳහන් වන්නේ පාටික වර්ගයේ චක්කවත්ති සීහනාද සූත්‍රයේ පමණි. මේ අනුව පාටික වර්ගයේ අන්තර්ගත කරුණු සෙසු වර්ග වලට වඩා සංවර්ධනාත්මක ගතියක් පෙන්නුම් කරන බව පෙනේ.

පුරාවෘත්ත පදනම් කරගත් පාටික වර්ගයේ එන සූත්‍ර දෙක නම් චක්කවත්ති සීහනාද හා අග්ගඤ්ඤ යන සූත්‍ර දෙකයි. මේ සූත්‍ර දෙකම පෞරාණික ගණයට වැටෙන බව බාපත්

කියයි. වින්ටර්නිට්ස් ද උද්ධෘත කරමින් මේ සූත්‍ර දෙක මුල් යුගයේ දහම් කොටස් වශයෙන් ගිණිය නොහැකි බව පාණ්ඩේ තම "Studies in the Origins of Buddhism" යන ග්‍රන්ථයේ දක්වා ඇත. මේ සූත්‍ර දෙකින් එන කථා පුවත් තුළ පළමු වැන්න පුරාණ ග්‍රන්ථවල එන කථාවලටත් දෙවැන්න සුරංගනා කථාවලටත් සමීප යැයි විචාරකයින් පෙන්වා දී ඇත. මේවා දෙවන මහාවර්ගයේ ආ ජාතක කථාවලට වඩා වෙනස් ස්වරූපයක් පෙන්නුම් කරන බව කියැවේ. චක්කවත්ති සීහනාදයේ පුවත සීලක්ඛන්ධයේ කූටදන්තයේ එන මහාවිජිතා වී නම් සක්විති රජුගේ කථාවට සමය.

පාටික වර්ගයේ එන ආටානාටිය සූත්‍රය දෙවන වර්ගයේ දෙවියන් බඹුන් පිළිබඳ විශ්වාසය පල කරන සූත්‍රවල නව අදියරක් ඉදිරියට තැබීමක් සේ සිතිය හැක. එය යක්ෂ විශ්වාසය කුළු ගන්වන සූත්‍රයකි. එය ආරක්ෂක මන්ත්‍රයකි. අගය කළ හැකි ධර්ම කොටස් කිසිවක් එහි නැත. දීඝ නිකායේ පිරිත් සූත්‍ර දෙකින් එකක් නම් මේ ආටානාටියයි. අනෙක මහා සමයයි. සුත්තනිපාතයේ රතන සූත්‍රාදිය සමග සසඳන කළ ආටානාටියේ කිසිදු වටිනාකමක් නොපෙනේ. මෙහි එන 'තතෝලා' 'තත්තලා' 'තතොතලා' 'ඔජසි තතොජසි යනාදි නම් වල අමුතු ස්වරූපයක් පෙනේ. මේවා සමහර විට අනාර්ය නම් විය හැක. මහායාන බුද්ධාගමේ පරිහානි යුගයේ අතිශයින් වැඩීමට පත් තන්ත්‍ර සාහිත්‍යයේ ආරම්භය ආටානාටිය සූත්‍රයේ දී හමුවේ යැයි පී වී බාපත් තම The Different strata in the Literary Material of the Digha Nikaya නම් ලිපියකින් අනාවරණය කර ඇත.

මෙම ආටානාටිය පසුකාලීන යැයි ඔහු පැහැදිලිවම ප්‍රකාශ කර පෙන්වා දී තිබේ. පොල්වත්තේ බුද්ධදත්ත හිමි ඒ පිළිබඳව මෙසේ දක්වා ඇත.

"මෙය ද මහායානිකායන් විසින් සම්පාදිත සූත්‍රයකි, යන්න මාගේ අදහසයි. මෙහි කිසිදු දහම් කොටසක් නැත. හුදු ආරක්ෂාව තකා සූත්‍ර දේශනා කිරීම බුදුහිමිගේ පුරුද්දක් නොවීය. මහායානිකයන්ගේ බොහෝ සූත්‍රවල මූලස්ථානය කරගෙන තිබෙන්නේ ගිජ්ඣකූට පර්වත යයි. මෙහිත් වරම් රජුන් පැමිණියේ ගිජ්ඣකූටයට යැයි කියා තිබේ.

මේ අනුව දීඝ නිකායේ වර්ග 3 කාලපරිච්ඡේද වශයෙන් අනුපිළිවෙලින් සම්පාදනය වූයේ යැයි අදහස් කළ නොහැකිය. ඇතැම් සූත්‍රවල පසුකාලීන යැයි පෙන්විය හැකි කොටස් පැහැලිවම තිබේ. එසේම ආකෘතිමය වශයෙන් ද ඒවායේ එන භාෂාව හා ගාථාවන් නිසා සමහර සූත්‍ර පශ්චාත් කාලීන බව පෙන්විය හැකිය. එසේම අන්තර්ගත විෂය කරුණු දෙස බලන විට ද දීඝ නිකායේ සූත්‍ර විවිධ යුගවලට අයත් සේ කල්පනා කිරීමට හොඳටම ඉඩකඩ තිබේ. නමුත් මුල්කාලීන සූත්‍රවලට පශ්චාත් කාලීන අදහස් හා භාෂාව උපයෝගී කිරීමෙන් එය පසුකාලීන යැයි ද පසුකාලීන සූත්‍රයකට පැරණි භාෂාවිලාෂයන් ආරෝපණය කිරීමෙන් හා

අදහස් දැක්වීමෙන් එය පැරණි සූත්‍රයක් යැයි ද සැළකිම සාධාරණ නොවන බව මෙහිදී අප සිතිය යුතුය. එමනිසා දීඝනිකායේ සූත්‍රවල කාල නිර්ණය ගැන උගතුන්ගේ අදහස් පරස්පරවිරෝධි බව කිව යුතුය.

### ආශ්‍රිත ග්‍රන්ථ


1. *දීඝ නිකාය -* I, II, බුද්ධ ජයන්ති සංස්කරණය
2. සුමංගල විලාසිනි දිඝ නිකාය අටුවාව 1 iii හේවාවිතාරණ, කොළඹ 1918, 1925
3. පොල්වත්තේ බුද්ධ දත්ත නාහිමි පාලි සාහිත්‍යය, රත්න පොත් ප්‍රකාශකයෝ, කොළඹ 10, 2005
4. Winternitz, M. *History of Indian Literatue vol II*, Motilal Banarisdass, Delhi (Reprint), 1993.
5. ඔලිවර් අබේනායක ලිපිය- *දීඝනිකාය සමාලෝචනය*, විද්‍යෝදය ධර්මශාස්ත්‍රිය සංග්‍රහය, 2005
6. බාපත් පි වි ‘දිඝ නිකාය එක් යුගයකට අයත් කෘතියක්ද?’ ධාරා, විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය, කැලණිය, 1958
7. ධම්මජෝති හිමි පරිනිර්වාණ සූත්‍රයේ ක්‍රමික විකාශය, පාරමි, අමුගොඩ ජයසුමන රාම මහා විහාරය, 1998